# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2454/16 – 2025 සැප්තැම්බර් මස 15 වැනි සඳුදා – 2025.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2025 අංක 93 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/FR/66.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/MDB/4/2/1/79/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 24 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, මැදදුම්බර.

II. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩසියපත්තුව දකුණ කෝරළේ සුළු කොට්ඨාසයේ, මාංගොඩ ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක මහ 5585 හා 2004.12.12 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1 – බෝගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.2315**

උතුරට: පී.පී.ඒ. 253 හි කැබලි අංක 7හි කොටසක්; නැගෙනහිරට: පී.පී.ඒ. 253 හි කැබලි අංක 7හි කොටසක් සහ කැබලි අංක 6; දකුණට: පී.පී.ඒ. 253 හි කැබලි අංක 7හි කොටසක්; බටහිරට: පී.පී.ඒ. 253 හි කැබලි අංක 8 සහ 10.

EOG 09 – 0136

1A – G 045375 – 19 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2025 අංක 95 දරන ආඥාව

මගේ යොමු අංකය: 4-3/24/2023/HA/96.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:MIL/LND/4/ACQVI/107.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

#### උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මිල්ලනිය.

II. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 647 හල්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හල්තොට ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක KA/MIL/2024/10 හා 2024.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර 'A' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0160 ක් පමණ වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A'** – ඇටඹගහවත්ත *හෙවත්* ඇටඹගහහේන – **ප්‍රමාණය: හෙක්. 0.0160**

උතුරට: පී. සී. ජේ. නිමල්ප්‍රිය හිමිකම් කියන ඇටඹගහවත්ත *හෙවත්* ඇටඹගහහේන; නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: මාර්ගය; බටහිරට: පී. එස්. එච්. පෙරේරා හිමිකම් කියන ඇටඹගහවත්ත *හෙවත්* ඇටඹගහහේන.

EOG 09 – 0144

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

### 2025 අංක 94 දරන ආඥාව

මගේ යොමු අංකය: 13/99/FR/85.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ල/ප්‍රාලේ/3/3/5/12/1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2025 ජූලි මස 24 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

#### උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, ලග්ගල.

II. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E387, මහලකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහලකොටුව ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක මූලික පිඹුරු භූ.මු.පි. 21, අතුරු පිඹුරු අංක 78, පත්‍ර අංක 38 හා 2021.01.29 දිනැති භූලක්ෂණාත්මක මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

1. **කැබලි අංක 1499 – පනවැල්ලවාඩිය – ප්‍රමාණය: හෙක්. 10.4271**

උතුරට: කැබලි අංක 1501; නැගෙනහිරට: කැබලි අංක 1501 සහ 1500; දකුණට: කැබලි අංක 1500 සහ 1501; බටහිරට: කැබලි අංක 1501.

2. **කැබලි අංක 1500 – පනවැල්ලවාඩිය – ප්‍රමාණය: හෙක්. 3.0647**

උතුරට: කැබලි අංක 1499 සහ 1501; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 1501; බටහිරට: කැබලි අංක 1501 සහ 1499.

EOG 09 – 0145

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.